# බස්නාහිර පළාත් සභාව

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

## බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය

## සඳහා ලංසු කැඳවීම - 2022

**ප්‍රසම්පාදන අංශය**

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**නො.204, පළාත් සභා ගොඩනැගිල්ල,**

**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

රිසිට් පත් අංකය:-........................................................................................................................

ගමනාන්තය:-.................................................................................................................................

සැපයුම්කරුගේ නම:-......................................................................................................................

බස් රථ අංකය:-...............................................................................................................................

<u>පටුන</u>

**1)** ලංසු ආරාධනා පත.............................................................(02/03)

**2)** උපදෙස් සහ කොන්දේසි පත්‍රිකාව...................................................(04/05)

**3)** ලංසු තොරතුරු පත්‍රිකාව.........................................................(06/07/08)

**4)** ටෙන්ඩර් ෆෝරමය.......................................................................(09)

**5)** මිල ගණන් ඉදිරිපත් කිරීමේ අයදුම්පත.............................................(10/11)

**6)** ටෙන්ඩරයේ අඩංගු වියයුතු ලියවිලි.....................................................(12)

පරීක්ෂා කිරීම සඳහා පමණි.

# බස්නාහිර පළාත් සභාව

## ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

බස්නාහිර පළාත් සභාවේ සේවය කරනු ලබන නිලධාරීන් ප්‍රවාහනය සඳහා බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි බස් රථ ධාවකයින්ගෙන් ලංසු කැඳවීම

2022 වර්ෂය සඳහා

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි බස්නාහිර පළාත් සභා කාර්යාල ගොඩනැගිල්ල වෙත පහත සඳහන් මාර්ග ඔස්සේ රාජකාරි දිනවල උදේ සහ සවස කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමට 2010 වර්ෂය හෝ ඊට පසු වර්ෂවල ලියාපදිංචි කළ වායු සමීකරණ රහිත බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | බස් රථය | ගමන් මාර්ගය |
|---|---|---|
| 1) | බත්තරමුල්ල - කළුතර | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, පානදුර, කළුතර, |
| 2) | බත්තරමුල්ල - කඩවත | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අංගොඩ, කැළණිමුල්ල,නාගහමුල, මාකොළ, මාවරමංඩිය, කඩවත. |
| 3) | බත්තරමුල්ල - අළුත්ගම | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, මොරොන්තුඩුව, වාඩියමංකඩ, කළුතර, අළුත්ගම. |
| 4) | බත්තරමුල්ල - කොස්ගම | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, කඩුවෙල, නවගමුව, හංවැල්ල, කොස්ගම. |

01) මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2021.12.15 දින සිට 2021.12.22 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.2500.00 ක් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු 10,000.00 ක්, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, 6 වන මහලේ පිහිටි මුල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. එසේම අයදුම්පතේ මුල් පිටපත සමග ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල ගෙවනු ලැබූ ලදුපතේ ඡායා පිටපතක්ද අමුණා එවිය යුතුය.

02) මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා එම ලියුම් කවර දෙක, 10″ × 4″ ප්‍රමාණයේ ලියුම් කවරයක බහා 2021.12.23 දින ප.ව. 1.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, හතර වන මහල, “බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල“, අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කල යුතුය. ලංසු බහලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම - 2022“ යනුවෙන් සඳහන් කළ යුතුය.

සභාපති

ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව

ප්‍රධාන ලේකම් කාරයාලය, බස්නාහිර පළාත,

බත්තරමුල්ල

## <u>ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වලංගු කොන්දේසි  හා උපදෙස්</u>

### <u>කොන්දේසි</u>

1. ලංසු ඉදිරිපත් කල හැක්කේ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ට පමණි. සේවාව ලබා ගැනීමට අපේක්ෂිත කාල සීමාව 2022.01.01 සිට 2022.12.31 දින දක්වා වේ.
2. ලංසු ඉදිරිපත් කරන පුද්ගලයා හෝ ආයතනය නමින් වාහනය ලියාපදිංචි කර තිබිය යුතුය. (ඒ බව සනාථ කිරීම සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් සාමදාන විනිශ්චයකාරවරයකු හෝ බලයලත් නිලධාරියකු වෙතින් සහතික කර ගෙන ඉදිරිපත් කල යුතුය.)
3. ඉල්ලුම් කරනු ලබන බස් රථ 2010.01.01 දින හෝ ඉන් පසු ලියාපදිංචි කරනු ලැබූ බස් රථ පමණක් විය යුතුය.
4. ලංසු තොරතුරු පත්‍රිකාවේ සඳහන් ආසන සංඛ්‍යාවට වඩා බස් රථයේ ආසන සංඛ්‍යාව අඩු නොවිය යුතුය. ඊට වඩා වැඩි ආසන සංඛ්‍යාවක් සහිත බස් රථ සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත.
5. බස් රථයේ ගමන් ගන්නා මගීන්ගේ ජීවිත අවදානම ආරක්ෂණ සහතිකය මගින් සම්පූර්ණයෙන්ම ආවරණය විය යුතුය. (අසීමිත රක්ෂණ ආවරණයක් විය යුතුය.)
6. තෝරා ගන්නා ලද සාර්ථක ලංසුකරුවන් අදාල බස් රථයේ  ආදායම් බලපත්‍රය, යෝග්‍යතා සහතිකය, අසීමිත රක්ෂණ සහතිකය, රියදුරුගේ රියදුරු බලපත්‍රය සහ වෛද්‍ය සහතිකය යන සහතික පත්‍රයන්හී මුල් පිටපත් ගිවිසුම් ගත වීමට ප්‍රථම ඉදිරිපත් කල යුතුය.
7. සාරානුකූලව ප්‍රතිචාර දක්වන අදාල ලංසුකරු හට ටෙන්ඩරය පිරිනැමීමේ දී ගිවිසුම් ගතවීම ප්‍රතික්ෂේප කලහොත් රු 10,000.00 ක ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුව රජයට පවරා ගනු ලබන අතර වසර තුනක් යන තෙක් මෙම කාර්යාල ප්‍රවාහන සේවාව සඳහා අයදුම් කල නොහැක.
8. සෑම මසකම පලමු සතිය තුල, පෙර මාසය උදෙසා බිල්පත, ධාවන  වේලා සටහන් සමග ඉදිරිපත් කල දින සිට  වැඩකරන දින 11කට ( එකොලහ) පසුත්, වැඩකරන දින 15කට ( පහලොව) පෙරත් ගෙවීම් කටයුතු සිදුකරනු ඇත.
9. සැපයුම්කරුගේ ක්‍රියාකලාප හේතුවෙන් පළාත් සභා පරිශ්‍රයේ දේපලකට හානියක් සිදුවුවහොත් හා/හෝ සේවාව අඛණ්ඩව පවත්වාගෙන නොයාම හේතුවෙන් යම් පාඩුවක් හෝ හානියක් සිදුවුවහොත් එකී අලාභය ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ගෙවිය යුතුය. එසේ නොගෙවන අවස්ථාවකදී සැපයුම්කරු වෙත ගෙවීමට නියමිත දෛනික සේවා ගාස්තුවෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
10. සැපයුම්කරු විසින් බස් රථය සඳහා ඉන්ධන ලබා දිය යුතුය.
11. වලංගු රියදුරු බලපත්‍රයක් සහිත මනා සෞඛ්‍ය තත්වයකින් යුත් විනයගරුක රියදුරකු සේවයේ යෙදවිය යුතුය. මගීන් ප්‍රවාහනය කරන බලපත්‍රයක් ( P.T. Licence)  ලබා තිබෙන රියදුරකු යෙදවීම වඩා යෝග්‍ය වේ.  ඔහු  අපරීක්ෂාකාරී ධාවනයක යෙදීම, ආචාරශීලී නොවීම, සහ යම්කිසි විනය විරෝධී ක්‍රියාවක් සඳහා චෝදනා ඉදිරිපත් වේ නම්, ඒ සම්බන්ධයෙන් සොයා බලා රියදුරු ඉවත්කිරීමට ක්‍රියා කල යුතුය.
12. බස් රථයේ  රියදුරු ඉවත් කර නව රියදුරකු සේවයේ යොදවන්නේ නම් ඒ පිළිබඳව පූර්ව අනුමැතිය ප්‍රධාන ලේකම්ගෙන් ලබා ගත යුතුය.
13. බස් රථයේ සේවාවන් සහ ධාවනයට අත්‍යාවශ්‍ය  නොවන නඩත්තු කටයුතු  රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකර ගත යුතුය.
14. හදිසි ආපදා අවස්ථාවකදී අනුමත බස් රථය සේවයේ යෙදවීමට නොහැකි විටදී සමාන පහසුකම් ඇති අවශ්‍ය ධාරිතාවයක් සහිත බස් රථයක් සේවයේ යෙදවිය යුතුය. කලින් හඳුනාගනු ලබන ආපදා තත්වයන් හේතුවෙන් බස් රථය සේවයේ යෙදවීමට නොහැකි අවස්ථාවලදී ප්‍රධාන ලේකම්ගේ  පූර්ව අනුමැතිය ලබා ගෙන වෙනත් බස් රථයක් සේවයේ යෙදවීමට කටයුතු කල යුතුය. එසේ ධාවනය කරන විකල්ප බස් රථය, ධාවනය කල හැකි කාල සීමාව උපරිම දින 14 කට යටත්වේ.
15. බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කරනු ලබන රාජකාරී දිනයන් හී මගීන් ප්‍රවාහනය සඳහා බස් රථය යොදා නොගත යුතුය.
16. ගමන් කරන කාර්යාල සේවකයින්ට අමතරව ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අවසර නොදුන් කිසිදු මගියෙකු ඇතුලත් කර නොගත යුතුය.

17. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් හෝ ඔහුගේ නියෝජිතයකු දැනුම් දුන් අවස්ථාවේ යෝජිත බස් රථය පරීක්ෂා කිරීමට අවස්ථාව සලසා දිය යුතුය.

18. තෝරා ගත් සැපයුම්කරුවන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සමග සේවා ගිවිසුමකට එළඹිය යුතුය.

19. බස් රථයේ රියදුරු විසින් පෙ.ව.8.15ට පෙර කාර්යාලය වෙත පැමිණීමට හා ප.ව.4.30 ට කාර්යාල පරිශ්‍රයෙන් පිටත් වීමට කටයුතු කල යුතු අතර පැමිණීමෙන් පසු සහ පිටත්වීමට පෙර ආරක්ෂක අංශයේ තබා ඇති ලේඛණය අත්සන් කල යුතුය.

20. ලංසු ලියකියවිලි ඇතුළත් සෑම පිටුවකම ලංසුකරු විසින් අත්සන් යොදා තිබිය යුතුය.

21. ඩීසල් මිල අඩු හෝ වැඩි වීමකදී ගෙවීම් කටයුතු පහත සමීකරණය මත රඳා පවතියි. එහිදී ආසන 42 ක සහ ඊට වැඩි බස් රථ සඳහා ඩීසල් ලීටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් හතරක් (04) ලෙසද, ආසන 42 ට අඩු බස් රථ සඳහා ඩීසල් ලීටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් හයක් (06) ලෙස සලකනු ලැබේ.

දෛනික ගෙවීම = (වර්තමාන ඉන්ධන මිල - ලංසු කැඳවන ආරම්භක දිනයේ ඉන්ධන මිල) x දිනකදී ධාවනය කරනු ලබන දුර
අඩුවීම/වැඩිවීම ඩීසල් ලීටරයකින් ධාවනය කල හැකි දුර

22. සෑම දිනකම බස් රථය ධාවනයට පෙර විෂබීජහරණයට ලක්කල යුතු අතර එය ධාවනයට පත් කිරීමේ දී යෝග්‍ය තත්වයෙන් පැවතිය යුතුය.

23. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වරින් වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව සේවා සැපයිය යුතුය.

24. ගිවිසුම් ගත කාලයට පෙර දෙපාර්ශවයෙන් කවර පාර්ශවයකට හෝ සේවාව අවසන් කිරීමට අවශ්‍ය වේ නම් ඒ බව ලිත් මාසයකට පූර්වයෙන් දැනුම් දිය යුතුය. බස් රථයේ ගමන් කරන මගීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් මතු වුවහොත් පූර්ව දැනුම් දීමකින් පසු සේවා සැපයුම්කරුගේ සේවය අවසන් කිරිමට කටයුතු කල හැකිය.

25. අයදුම්කරුවන් හට ඕනෑම මාර්ගයක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කල හැකි අතර, එක් ලියාපදිංචි අංකයක් සහිත බස් රථයකින් එක් ගමන් මාර්ගයක් සඳහා පමණක් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

26. සමාගමක් හෝ ලියාපදිංචි ව්‍යාපාරයක් විසින් අයදුම් කරන්නේ නම් ව්‍යාපාර ලියා පදිංචි සහතිකයේ සහතික කල ඡායා පිටපතක් ඉදිරිපත් කල යුතුය.

27. ඉහතින් දක්වා ඇති කොන්දේසි වලට අනුකූල නොවී රාජකාරි සඳහා යොදවන බස් රථ සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

## උපදෙස්

01) ප්‍රවාහන පහසුකම් සැපයීමට යෝජිත බස් රථයට අමතරව කොපමණ බස් රථ ලංසු ඉදිරිපත් කරන්නා සතු ද යන වගත් ඒ පිළිබඳ වර්ගය, මාදිලිය,හා ආසන සංඛ්‍යාව ආදී විස්තර ඉදිරිපත් කල යුතුය.

02) බස් රථයේ ධාවන සේවාවන් හා ටයර් මාරු කිරීම් රාජකාරී සඳහා බාධාවක් නොවන අයුරින් ඉටුකර ගත යුතුය.

03) ඉදිරිපත් කරන වාහනයේ කොපමණ මගීන් ප්‍රවාහනය කල හැකිදැයි සටහන් කල යුතුය.

**<u>ලංසු තොරතුරු පත්‍රිකාව</u>**

ප්‍රසම්පාදන අංශය,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

නො.204, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල,

04 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

බත්තරමුල්ල.

ලිපිගොනු අංකය - CSWP/ADM/24 – 97/FI/15

1) බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි බස්නාහිර පළාත් සභා කාර්යාල ගොඩනැගිල්ල වෙත පහත සඳහන් මාර්ග ඔස්සේ නියමිත ආසන සංඛ්‍යාව හෝ ඊට වැඩි ආසන සංඛ්‍යාවකින් යුත් බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | බස් රථය | ආසන සංඛයාව | ගමන් මාර්ගය |
|---|---|---|---|
| 1) | බත්තරමුල්ල - කළුතර | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, පානදුර, කළුතර, |
| 2) | බත්තරමුල්ල - කඩවත | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, කොස්වත්ත හංදිය, වල්පොල හංදිය, අංගොඩ, කැළණිමුල්ල,නාගහමුල, මාකොළ, මාවරමංඩිය, කඩවත. |
| 3) | බත්තරමුල්ල - අළුත්ගම | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, අතුරුගිරිය අධිවේගී මාර්ගය හරහා, ගැලනිගම අධිවේගී මාර්ගය දක්වා, බණ්ඩාරගම, මොරොන්තුඩුව, වාඩියමංකඩ, කළුතර, අළුත්ගම. |
| 4) | බත්තරමුල්ල - කොස්ගම | 54 හෝ ඊට වැඩි | පළාත් සභා කාර්යාලය, මාළඹේ හංදිය, කඩුවෙල, නවගමුව, හංවැල්ල, කොස්ගම. |

02) ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

03) ලංසු අවසන් කරන දින සිට දින 91 දක්වා ලංසු කාලය වලංගු විය යුතුය.

04) ලංසු ලියකියවිලි ඇතුළත් සෑම පිටුවක්ම ලංසුකරු විසින් අත්සන් යොදා තිබිය යුතුය. සමාගමක් නම් නිල මුද්‍රාව තබා අත්සන් කල යුතුය.

05) බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, දරණ ස්ථානයේ, ප්‍රධාන ලේකම් කාර්යාලය (පාලන) අංශයට අයත් ප්‍රසම්පාදන කාර්යාලය තුළදී කිසිදු ගෙවීමකින් තොරව කාර්යාල වේලාව තුළදී ලේඛණ පරීක්‍ෂා කළ හැක.

06) මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2021.12.15 දින සිට 2021.12.22 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.2500.00 ක් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු 10,000.00 ක්, බත්තරමුල්ල, කොස්වත්ත,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, 6 වන මහලේ පිහිටි මුල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. එසේම අයදුම්පතේ මුල් පිටපත සමග ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල ගෙවනු ලැබූ ලදුපතේ ඡායා පිටපතක්ද අමුණා එවිය යුතුය.

07) මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක, 10” × 4” ප්‍රමාණයේ ලියුම් කවරයක බහා, 2021.12.23 දින ප.ව. 1.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, හතරවන මහල (04), “බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල“, අංක.204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී (පාලන) නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ “බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම” යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

08) තෝරා ගත් සැපයුම්කරු ප්‍රධාන ලේකම් සමග ගිවිසුමකට එළඹිය යුතුය.

09) ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම සඳහා කිසිදු අයුරකින් සලකනු නොලබන අතර තැපෑලේදී ඇතිවන ප්‍රමාදවීම් සඳහා ප්‍රසම්පාදන අංශය, ප්‍රධාන ලේකම් කාර්යාලය වග කියනු නොලැබේ.

10) මෙහි සඳහන් උපදෙස් වලට අනුකූලතාවය නොදක්වන ඕනෑම ටෙන්ඩරයක් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11) මෙම ටෙන්ඩරය ඕනෑම අවස්ථාවක දී අවලංගු කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතුය.

12) වැඩිදුර විස්තර සඳහා කාර්යාල වේලාව තුළදී දුරකථන අංක 011-2093249 මගින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ, ගණකාධිකාරී (පාලන) ඇමතිය හැකිය.

සභාපති

ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව

ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත,

<u>ටෙන්ඩර් පෝරමය (Form of Bid)</u>

සභාපති,

ප්‍රසම්පාදන කමිටුව

ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත,

(සටහන: ටෙන්ඩර් ලේඛනය නිකුත් කිරීමට ප්‍රථම, (*) සලකුණ දක්වා ඇති සියළුම හිස්තැන් සේවාදායා විසින් නියමිත පරිදි පිරවිය යුතුය.)

කොන්ත්‍රාත්තුවේ නම: බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවාව

ප්‍රධාන ලේකම් (බ/ප) වෙතට,

(CSWP/ADM/24 – 97/FI/15)

මහත්මයාණෙනි,

1. පහත අත්සන් කරන මම/අපි, ඉහත සඳහන් කාර්යය ඉටුකිරීම සඳහා සියලු කොන්දේසි,උපදෙස් , හා ලංසු තොරතුරු පත්‍රිකාව, පරීක්ෂා කිරීමෙන් අනතුරුව,එම කාර්ය ඉහත සඳහන් කොන්ත්‍රාත් කොන්දේසි, සංශෝධන අනුව ශ්‍රී ලංකා මුදලින් *රු. ........................................ ................................................................(VAT රහිත) (රු. ................................ කට) (VAT රහිත) හෝ ඉහත කී කොන්දේසි වලට අනුකූලව තීරණය කරනු ලබන වෙනත් මුදලකට ඉටු කිරීමට පොරොන්දු වන්නෙමි./වන්නෙමු.
2. මගේ/අපගේ ටෙන්ඩරය පිළිගතහොත් 2022/01/01 සිට කාර්ය ආරම්භ කිරීමටත්, 2022/12/31 දින දක්වා කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුවට අදාල මුළු සේවා සැපයීමටත් මම/අපි පොරොන්දු වෙමි./වෙමු.
3. ලංසු තොරතුරු පත්‍රිකාවෙහි 3 වගන්තියේ සඳහන් කාල සීමාව තුල මෙම ටෙන්ඩරය වෙනුවෙන් මම/අපි බැඳි සිටිමට එකඟ වන අතර, එම කාල සීමාව ඉකුත් වීමට පෙර ඕනෑම අවස්ථාවක මෙම ටෙන්ඩරය භාර ගැනීමට පොරොන්දු වෙමි./වෙමු.
4. විධිමත් ගිවිසුම පිළියල කොට ඊට එළඹෙන තෙක් මෙම ටෙන්ඩරය සහ ඔබගේ ලිඛිත පිරිනැමීමේ ලිපිය මගින් ඔබ හා අප අතර, නෛතික බැඳීමක් ස්ථාපිත කෙරෙන බව මම/අපි පිළිගනිමි./මු.
5. අවම ටෙන්ඩරය පිළිගැනීමට හෝ ඔබ වෙත ලැබෙන ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීමට හෝ ඔබ බැඳී නොසිටින බව මම/අපි දනිමි./දනිමු.
6. ........................................................................................වෙනුවෙන් ටෙන්ඩරය අත්සන් කිරීමට ..........................................................................................වශයෙන් යථා පරිදි බලයලත් වර්ෂ 21............ක්වූ..........................මස................................දිනදී ය.

අත්සන: ....................................................

ලිපිනය: ....................................................

සාක්ෂි: ....................................................

# බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම

## 2022 වර්ෂය සඳහා අයදුම් පත්‍රය

වාහනයේ ලියාපදිංචි අයිතිකරු පිළිබඳ තොරතුරු :-

| | | |
|---|---|---|
| 01 | ප්‍රවාහන පහසුකම් සපයන ආයතනයේ /පුද්ගලයාගේ නම | |
| 02 | ලිපිනය | |
| 03 | හැඳුනුම්පත් අංකය | |
| 04 | ග්‍රාම නිලධාරී වසම | |
| 05 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
| 06 | දිස්ත්‍රික්කය | |
| 07 | දුරකථන අංකය | |
| 08 | විද්‍යුත් තැපැල | |
| 09 | ෆැක්ස් | |

(පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඇමිණිය යුතුය.)

වාහනය පිළිබඳ තොරතුරු :-

| | | |
|---|---|---|
| 10 | වාහනයේ වර්ගය | |
| 11 | වාහනයේ මාදිලිය | |
| 12 | වාහනයේ ආසන සංඛ්‍යාව(රියදුරු අසුන හැර) | |
| 13 | වාහන අංකය | |
| 14 | නිෂ්පාදන වර්ෂය | |
| 15 | ලියාපදිංචි වර්ෂය | |

පරීක්ෂා කිරීම සඳහා පමණි.

<u>ගමන් මාර්ගය සහ ඉදිරිපත් කරන ලද මිළ ගණන් පිළිබඳ තොරතුරු :-</u>

| | | | |
|---|---|---|---|
| 16 | මාර්ග විස්තරය | | |
| 17 | වැට් අංකය ( තිබේ නම්) | | |
| 18 | දෛනික ගාස්තුව - ඉලක්කමෙන් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු රහිත | | |
| 19 | දෛනික ගාස්තුව - අකුරින් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු රහිත | | |
| 20 | දෛනික ගාස්තුව - ඉලක්කමෙන් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු සහිත | | |
| 21 | දෛනික ගාස්තුව - අකුරින් (අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සහිතව) VAT බදු සහිත | | |
| 22 | අයදුම්කරුට අයත් වෙනත් බස් රථ | ලියාපදිංචි වර්ෂය | |
| | | ආසන ගණන | |
| | | වාහන මාදිලිය | |
| | | වර්ගය | |
| 23 | අයදුම්පත්‍ර ගාස්තු ගෙවූ ලදුපත් අංකය (පිටපත් ඇමිණිය යුතුය.) | | |
| 24 | ඇප තැන්පතු ගාස්තු ගෙවූ ලදුපත් අංකය (පිටපත් ඇමිණිය යුතුය.) | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මා ප්‍රකාශ කරමි. මෙම සේවාව සඳහා මා තෝරා ගනු ලබන්නේ නම් අදාල කොන්දේසි හා නියමයන්ට යටත්ව සේවාව විධිමත්ව පවත්වාගෙන යාමට එකඟ වන බව මෙයින් ප්‍රකාශ කරමි.

.................................... ..........................................................

දිනය අයදුම්කරුගේ අත්සන

## වෙනත් කරුණු (සැලකිය යුතුයි.)

## ටෙන්ඩරයේ අඩංගු විය යුතු ලේඛණ.(Check List)

| | | පිටු අංකය | ඉදිරිපත් කර ඇත / නැත |
|---|---|---|---|
| 1) | නිසි අයුරින් පුරවා අත්සන් කරන ලද ටෙන්ඩර් පෝරමය (Form of Bid) | (09) | |
| 2) | මිල ගණන් යෙදූ ඉල්ලුම් පත්‍රය. | (10) | |
| 3) | අනු අත්සන් යෙදූ උපදෙස් සහ කොන්දේසි පත්‍රිකාව | (04/05) | |
| 4) | අනු අත්සන් යෙදූ ලංසු තොරතුරු පත්‍රිකාව | (06/07/08) | |
| 5) | බස් රථය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්. | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 6) | ග්‍රාම නිලධාරී සහතිකය | ඇමිණිය යුතුය. | |
| 7) | වැට් (VAT) සඳහා ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක්. | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 8) | අයදුම්පත්‍ර සහ ඇප තැන්පතු ගාස්තු ගෙවූ ලදුපතෙහි පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 9) | ව්‍යාපාර නාම ලියා පදිංචි සහතිකයේ සහතික කල ඡායා පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |

- මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක, 10" × 4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා, 2021.12.23 දින ප.ව. 1.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, හතරවන මහල (04), "බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල", අංක.204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී (පාලන) නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

## ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

## බස්නාහිර පළාත් සභා කාර්යාලීය කාර්ය මණ්ඩලය වෙත ප්‍රවාහන සේවා සැපයීම සඳහා ලංසු කැඳවීමයි.

බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සඳහා 2022 වර්ෂ තුල ප්‍රවාහන සේවා සැපයිමට සුදුසු සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීම පිණිස බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වෙතින් ලංසු කැඳවීම් කරනු ලැබේ.

2021.12.15 දින සිට 2021.12.22 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.2500.00 ක් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු 10,000.00 ක්, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, 6 වන මහලේ පිහිටි මුල්‍ය අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත, 4 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. මෙම කාලය තුල ප්‍රධාන ලේකම් කාර්යාලීය (පාලන) අංශයේදී හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ adm.chiefsec.wp.gov.lk වෙබ් පිටුව මගින් ලංසු ලේඛණ පරීක්ෂා කිරීම සිදු කල හැක.

මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක, 10" × 4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා, 2021.12.23 දින ප.ව. 1.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, හතරවන මහල (04), "බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල", අංක.204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගණකාධිකාරී (පාලන) නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම" යනුවෙන් සඳහන් කල යුතුය.

ලංසු ප්‍රදානය පිළිබඳ අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ .

සැ.යු. :- මෙම ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් නිකුත් කර ඇති ලියවිලි පමණක් භාවිතා කල යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර 0112093249 මගින් ගණකාධිකාරී (පාලන) අමතා ලබාගත හැක.

සභාපති,

ප්‍රසම්පාදන කමිටුව

ප්‍රධාන ලේකම් කාර්යාලය,

බස්නාහිර පළාත,

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

බත්තරමුල්ල

2021.12.15